# ශ්‍රීපති සිදුවීම

හිටපු අමාත්‍ය ශ්‍රීපති සුරියාරච්චි මහතා පසුගිය සෙනසුරාදා අත් අඩංගුවට ගෙන රිමාන්ඩ් බාරයට යැවීමත් ඔහුගේ සහායකයකුව සිය නාවික හමුදා නිලධාරියකු කොටින්ට සම්බන්ධ යැයි අත්අඩංගුවට ගැනීමත් අප ජීවත්වන්නේ අබුද්දස්ස කාලයක බව පෙන්වන තවත් සිදුවීම් දෙකකි. .

ශ්‍රීපති සූරියාරච්චි මහතා අත් අඩංගුවට ගැනීමත් රිමාන්ඩ් බාරයට පත් කිරීමත් දේශපාලන පළි ගැනිමක් නොවන බවට බොහෝ තර්ක ඉදිරිපත් විමට ඉඩ තිබේ. නමුත් සාමාන්‍ය ජනමනස පවා මේ වනාහී දේශපාලන පළි ගැනීමක් බව තිරණය කරනවා ඇත. එමෙන්ම 2001 දී බාරදුන් බව කියන රජයේ වාහනයක් සම්බන්ධ මෙම චෝදනාවෙන් ශ්‍රීපති නිදහස් වීමට බොහෝ දුරටම ඉඩ තිබේ.

නාවික නිලධාරියා කොටි සංවිධානයට සම්බන්ධ යැයි යන චෝදනාව ද පෙනෙන පරිදි ගොතන ලද එකකි. ඔහු අත් අඩංගුවට ගැනුනේ මහින්ද- කොටි ගිවිසුම ගැන සාක්ෂියක් දිමට සිටි නිසා යැයි ශ්‍රීපති සූරියාරච්චි මහතා කියයි. ඔහුගේ බිරිද කියන්නෙ සිය සැමියා සහමුලින්ම නිර්දෝශි බවත් මෙම චෝදනා නිසා තම දරුවන්ට පාසැල් යාමට පවා බැරි තත්ත්වයක් උදා වී ඇති බව යි.

## බිය ජනක පූර්වා දර්ශයක්

නමුත් මෙම සිදුවීම් දෙකෙහි ඇගවීම බරපතල ය. සිදුවීම් දෙකම පෙන්නුම් කරන්නේ විරුද්ධවාදීන්ට එරෙහිව ක්ෂනිකවම චෝදනා සකස් කිරීමටත් ඒවාට පූර්ව ප්‍රසිද්ධියක් ලබා දී ඒ අනුව පියවර ගැනීමටත් සමත් යාන්ත්‍රණයක් ආණ්ඩුව සතුව තිබෙන බව යි.

ශ්‍රීපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරණ සටනේ රූපවාහිනී ක්ෂේත්‍රයේ ප්‍රබලයකු විය. රනිල් වික්‍රමසිංහ විරෝධී- සටන් විරාම ගිවිසුම් විරෝධී රූපවාහිනී සටන ගෙන ගියේ ඔහු ය. එකළ ඔහු වීරයකු ලෙස සැලකූ ආණ්ඩුවාදී ජනමාධ්‍ය වන්දිබට්ටයෝ දැන් ඔහුට දිගට හරහට පහර දෙති. අඩුම වශයෙන් ඔහුට එරෙහිව කැරෙන චෝදනාවන්ට විනාඩියක හෝ පිලිතුරකට ඉඩ නොදෙති.

එක් අතෙකින් එල්ටීටීඊය සමඟ සටන් විරාම ගිවිසුමකට එලඹීමට විරුද්ධව මහා ප්‍රචාරක ව්‍යාපාරයක් කරගෙන යන අතරතුරම අනෙක් අතට එල්ටීටීඊ ය සමඟ සාකච්ජා කිරීමේ පිලිවෙතක් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරණ උපාය මාර්ගය වූ බව (ගිවිසුමකට එළඹියේ ද නැත් ද යන්න කෙසේ වෙතත්) දැන් පැහැදිලිව පෙනී යන කරුණකි.

මංගල - ශ්‍රීපති පිලිබඳ සිදුවීමේ දී සෑම පැත්තක්ම වාර්තාකරන වෘත්තීය ජනමාධ්‍ය සම්ප්‍රදායක් මෙරට බහුතරයක් ජනමාධ්‍ය සතුව තිබුනේ නම් කොතරම් අවබෝදාත්මක සහ ගැඹුරු සාකච්ජාවක් නිර්මාණය වීමට ඉඩක් තිබුනි ද?

## වටකර පහරදීම

නමුත් ආණ්ඩුවේ වටකර පහර දීමේ මූලෝපයට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් සහාය දෙන බහුතර ජනමාධ්‍ය එවැනි ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ජාවකට ඉඩක් සැපයුයේ නැත.

මව්බිම පුවත්පත දණ ගැස්සවීමේ ක්‍රියා දාමය තුළ ද දක්නට ලැබුනේ රාජ්‍යයේ සෑම අංශයක්ම යොදා ගනිමින් විරුද්ධවාදීන්ට වටකර පහර දීමේ මූලෝපායක් අනුව ආණ්ඩුව කටයුතු කරන සැටි ය. මව්බිම ජනමාධ්‍යවේදිනී පරමේශ්වරී අත් අඩංගුවට ගැනීම සහ රදවා තබා ගැනීම, එහි මුල්‍ය කලමනාකරු දුෂ්යන්ත බස්නායක අත් අඩංගුවට ගැනීම. බදු නිලධාරීන් මව්බිමට පැනීම, ජනාධිපතිවරයා විසින්ම මව්බිමට වාග් ප්‍රහාරයත් එල්ල කිරීම. සහ මව්බිම හිමිකරුගේ වානිජ ව්‍යාපාර බිඳ වැටෙන පරිදි බැංකු ගිණුම් තහනම් කිරීම සහ අනෙක් පුවත්පත් මෙම සිදුවීම් වාර්තාකරණයෙන් වැළැක්වීම එම මුලෝපායට අයත් විය.

විරුද්ධවාදීන් සහ විරුද්ධ අදහස් මැඩලීම බලගතු දේශපාලන මූලෝපායක් කර ගත් මෙවැනි ක්‍රියදාමයක් අප අවසන් වරට අත් දුටුවේ ජනාධිපති ජේ.ආර්. සමයේ දීය. ජේ.ආර්. තමා ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වයක් ගෙන යන බව නොකියා කියූ රාජ්‍ය පාලකයකු විය. ඔහු  විපක්ෂය බෙලහීන කලේ ය. ජනමාධ්‍ය සිය ග්‍රහණයට ගත්තේ ය. ශ්‍රේෂ්ඨාධිකරණයට සිය සිතැගි අනුව පත්කලේ ය.  එම අදුරදර්ශි පාලනයේ විපාක වශයෙන් අපට අවසානයක් නැති උතුරේ සන්නද්ධ අරගලය ද 88 -90 යුගයේ දකුනේ සන්නද්ධ අරගලය ද දායාද විය.

ජේ. ආර් ජයවර්ධන 1981 දෙසැම්බර් 31වනදා වන විට උතුරේ සන්නද්ධ අරගලය අහෝසි කිරීමට බ්‍රිගේඩියර් බුල් වීරතුංග යාපනයට යැවූයේ ය. එම අහෝසි කිරීමේ ක්‍රියාදාමයේ විපාක දෙමළ ජනයා අත් දුටුවේ ඉම්බන් වැනි සමාජ ක්‍රියාකාරීන්ගේ මොළය හිස්කළ මලසිරුරු මහමග ප්‍රදර්ශනය වීමෙනි. ඉන් අනතුරුව ජේ.ආර්ගේ ආශිර්වාද ලත් 83 දෙමළ විරෝධි  කෝලාහලය ඇවිලුනි.

## තස්ත්‍රවාදයට ත්‍රස්තවාදය

ත්‍රස්තවාදය විසින් සාමන්‍ය ජනයා දහසක් ඝාතනය කිරීම වැලැක්වීම සඳහා එක් ත්‍රස්තවාදියකු මර්ධනය කිරීම පිනිස සිය දෙනෙකු විනාශ කිරීම (එනම් අහිංසකයින් 99 දෙනෙකු ද විනාශ කිරීම) 1971 දී ද 1988 -90 ජවිපෙ මර්ධනයේ දී සාර්ථක වූ උපාය මාර්ගය බව පසුගිය සති අන්ත ඉංග්‍රිසි පුවතපතක කතුවරයා ලියා තිබුනි. ඔහු කියා සිටින්නේ අද ක්‍රියාත්මක වන්නේ ද එම පිලිවෙත බව යි.

නමුත් උතුරු නැගෙනහිර දී දකුනේ දීට වඩා තීව්‍ර ලෙස ක්‍රියාවට නගන ලද එම පිලිවෙත වසර 25ක් පුරා සාර්ථක නොවූයේ මන්ද යන්න එම කතුවරයා ප්‍රශ්න කොට තිබුණේ නැත.

සිංහල කොටි කණ්ඩායමේ නායකයින් ලෙස හැදින්වුනු දෙදෙනෙකු යුද හමුදා බුද්ධි අංශයන්ට සම්බන්ධ වී සිටි බවට කැරෙන චෝදනා සහ යම් දුරකට හෝ එම ක්‍රියාදාමය පිටුපස හමුදා බුද්ධි අංශ සිටි බවට කැරෙන චෝදනා සත්‍ය නම් මෙම විරුද්ධවාදීන් මර්ධනය කිරීමේ පසුබිම තුල ඉන් කෙරෙන ඇගවීම ඉතා බිය ජනක වනු ඇත. එය හරියට හිට්ලර්ගේ දාමරික පිරිස් ජර්මානු පාර්ලිමේන්තුව වූ රයිශ්ටැග්යට ගිනි තබා එය විරුද්ධවාදීන් පිට යැවීම වැනි ය. මර්ධනයේ ආරම්භය එය විය.

නමුත් කණගාටුවට කරුණ වනු ඇත්තේ බහුතර ජනමාධ්‍ය විසින් මෙම කාරණය ද නිහඬතාවයේ කුමංත්‍රණය මගින් යටපත් කර දමනු ලැබීමට ඇති ඉඩ කඩ යි.

## සිංහල කොටි

අද විරුද්ධවාදින් යටපත් කිරීමේ දේශපාලන උපාය මාර්ගය වන්නේ  සිංහල කොටි ලෙස හංවඩු ගසනු ලැබීම යි. එලෙස හංවඩු ගසා රජයේ සහ පුද්ගලික අංශයේ ගැති

ජනමාධ්‍ය මගින් හෙළා දැකීම යි. එම හෙළා දැකීමෙන් පසු සිය ගම්බිම්හි ජීවත්වීමට නොහැකි පරිසරයක් නිර්මාණය කිරීම යි.

සිංහල කොටි කණ්ඩායමක් අත් අඩංගුවට හසු වීමත් ඔවුන්ගේ පුහුණු ජායාරූප සහ පාපොච්චාරන ප්‍රසිද්ධියට පැමිණ විමත් මගින් මෙම සමාජ දේශපාලන පසුබිම නිර්මාණය විය. දැන් සිංහල කොටි යථාර්තයකි. එබැවින් පෙරදා වනතුරු මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ බලකනු ලෙස සිටි මංගල සහ ශ්‍රීපති පවා, නාවික හමුදාවේ නිලධාරීන් පවා කොටි සහකරුවන් ලෙස හංවඩු ගැසීමට පුලුවන.

එවැනි පුද්ගලයින් නඩු නැතිව දීර්ග කාලයක් රදවා තබා ගැනීමේ යථාර්තය දැනට චෝදනා නැතිව  සිව් මසක් අත් අඩංගුවේ සිටින පරමේශ්වරීගෙන් පෙන්නුම් කෙරෙයි. එලෙස හංවඩු ගැසෙන පුද්ගලයින්ට පැමිනවිය හැකි අනෙක් හිරිහැර ටිරන් අලස්ට පැමිණ වූ නීතියෙන් බැහැර දඩුවම් වලින් මූර්තිමත් වෙයි.

ප්‍රජාතන්ත්‍රවාදී භාවිතය මැනෙන මිනුම් දණ්ඩ වනුයේ තමන් එකඟ නොවන පුද්ගලයින් සහ බලවේග ප්‍රජාතන්ත්‍ර විරෝධි ලෙස යටපත් කරන විට කෙනෙකු ගන්නා ආකල්පය ය යන පැරණි කියමන අදටත් වටී.

සුනන්ද දේශප්‍රිය